චක්‍රලේඛ අංක 06/2015

සමූපකාර සේවක කොමිෂන් සභාව,
උතුරු පළාත් සභාව,
2015.06.09

උතුරු පළාතේ සියළුම සමූපකාර සමිති සහ සංගම්වල සභාපතිවරුන් වෙත.

## සමූපකාර සේවකයින්ට සමූපකාර පුහුණුව සඳහා

## මුදල් ආධාර සහ දිරි දීමනා ගෙවීම

සමූපකාර සේවක කොමිෂන් සභාවේ 1998.12.28 දිනැති 39/98 දරණ "සමූපකාර සේවකයින් සමූපකාර පුහුණුව ලබා ගැනීම සඳහා මුල්‍ය දිරිගැන්වීම් ගෙවීම" යන චක්‍රලේඛයේ අන්තර්ගතය තව කරුණු සහිතව ප්‍රකාශ කරනු ලැබේ.

1. සමූපකාර සේවකයින්ගේ කාර්‍යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා උතුරු පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවේ අනුග්‍රහ සහිතව දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා වන උනන්දුව ඇති කිරීමේ අරමුණින් දිරි ගැන්වීම් කරනු ලැබේ.

2. 1988.06.30 දිනැති 165/88 දරණ චක්‍රලේඛයේ සඳහන් පස් වර්ගයේ සේවකයින් වර්ගයට අයත් තනතුරු සහ එම තනතුරු සඳහා සමත් විය යුතු පුහුණු පාඨමාලාව පහත සඳහන් අයුරින් දක්වනු ලැබේ.

| අනු අංකය | පිරිස්බල වර්ගය | තනතුර | සමත් වියයුතු පාඨමාලාව |
|---|---|---|---|
| 01 | අධි උසස් පෙළේ කළමණාකාර මට්ටම | වැටුප් පරිමාණය 1, 2, 3 සහිත තනතුරු | සමූපකාර කළමණාකරනය, ගණකාධිකරණ සහතික පත්‍ර පුහුණු පාඨමාලාව. |
| 02. | ජ්‍යේෂ්ඨ කළමණාකරන මට්ටම | වැටුප් පරිමාණය 3, 4, 5, 6, 7 සහිත තනතුරු | සමූපකාර සේවක සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව. |
| 03. | මධ්‍යම කළමණාකරන මට්ටම | වැටුප් පරිමාණය 6, 7, 8, 9, 10 සහිත තනතුරු | සමූපකාර සේවක සහතික පත්‍ර උසස් පෙළ/සාමාන්‍ය පෙළ |
| 04. | අධීක්ෂණ මට්ටම | වැටුප් පරිමාණය 9, 10, 11, 12, 13 සහිත තනතුරු | සමූපකාර සේවක සහතික පත්‍ර සාමාන්‍ය පෙළ |
| 05. | ක්‍රියාකාරි මට්ටම | වැටුප් පරිමාණය 13, 14, 15, 16, 17 සහිත තනතුරු | සමූපකාර සේවක සහතික පත්‍ර කණිෂ්ඨ පෙළ/සාමාන්‍ය පෙළ |

03. ඉහත සඳහන් පිරිස්බලයට අදාල තනතුරුවල සේවය කරන සේවකයින් තමන්ගේ තනතුරට අදාල සහතික පත්‍ර පාඨමාලා සම්පූර්ණ කර සමත් වන්නේ නම් එම සේවකයින්ට ඔවුන් අවසානයට උපයා ලබාගත් වැටුප් වර්ධකයේ අගය මෙන් තුන් ගුණයට සමාන මුදල දිරිගැන්වීමේ මුදල වශයෙන් මාසිකව ගෙවිය යුතුය.

04. සමූපකාර සේවකයෙකු තම පිරිස්බලයට අදාල සමූපකාර පුහුණු පාඨමාලාව එකකට පමණක් මෙසේ දිරි දීමනා ලැබීමේ හිමිකම් ඇත. එසේවුවද අදාල පුහුණු සහතිකය නොලබා රට උසස් පුහුණු සහතික ලබන්නේ නම් තම පිරිස්බල වර්ගයට අදාල වගු 3 හි සඳහන් දිරි දීමනා මුදල මාසිකව ලබා ගත හැකිය.

05. දැනට සේවයේ සිටින සේවකයෙකු හෝ නව පත්වීම් ලබන්නන් හෝ උසස්වීම් ලබන සෙවකයින් සමූපකාර සේවක සහතික පත්‍ර සුදුසුකම මූලික අධ්‍යාපන සුදුසුකම වශයෙන් සලකන්නේ නම් මෙම දිරි දීමනා මුදල ලබා ගැනීමට නුසුදුසුස්සෙකු වේ.

06. මෙම දිරි දීමනා වාර්ෂික වැටුප් වර්ධකය සමග එකතු කල නොකල යුතුය. එසේවුවත් සේවක ගෙවීම් ලැය්ස්තුවේ තනි තීරුවේ ගණනය කර ගෙවිය යුතුය.

07. සේවකයෙකු තම වැටුප් පරිමානයේ උපරිම වැටුප් තලයට පැමිණ ඇත්නම් අවසානයට උපයා ගත් වැටුප් වර්ධක මුදල අනුව ගණනය කරන මෙම දිරි දීමනාවට හිමිකරුවෙකු වේ.

08. සමූපකාර සමිතියක යම් කිසි තනතුරකට පත්වීම් ලබන සේවකයෙකු තම පිරිස්බලයට අදාල සහතික පත්‍ර පුහුණුව අදාල තනතුරට පත්වීම් ලැබූ දිනය සිට වර්ෂ 5 ක කාලය තුල සම්පූර්ණ කර මෙම දිරි දීමනා ගෙවීම ලබාගත යුතුය. එවැනි සේවකයින් තම පුහුණුව සාර්ථකව නිම කරන විට දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලය විසින් තීරණය කරන මහු සහභාගි වන පුහුණු වියදමින් 30/= ක් උතුරු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබේ. මෙම විධි විධානය 2015.06.01 දින සිට ක්‍රියාවට නග්වන අතර කලින් කලට පූර්ව දැනුම් දීමකින් ප්‍රතිශතය සංශෝධනය කරනු ලැබේ.

09. යම් කිසි තනතුරක වර්ෂ පහකට අධික කාලයක් එම තනතුරේම සේවය කරන සේවකයෙකු තම පිරිස්බලයට අදාල සමූපකාර සහතික පත්‍ර පුහුණු පාඨමාලාව ප්‍රමාද වී නිම කර ඇත්නම් හෝ ඉදිරි කාලයේදී නිම කර ඇත්නම් ඔහු අවසාන වරට ලබාගත් වැටුප් වර්ධකයට සමාන මුදල (එක් වැටුප් වර්ධක මුදල) දිරි දීමනා මුදල වශයෙන් ලබා ගත හැකිය. මෙම ගෙවීම් 2015.06.01 සිට ක්‍රියාත්මක වන හෙයින් හිග ගෙවීම් පිළිබඳ ඉල්ලීම් සැලකිල්ලට නොගත යුතුය.

10 8 වැනි සහ 9 වැනි වැටුප් පරිමාණයේ සේවකයින් තම පිරිබලයට අදාල සමූපකාර සහතික පත්‍රයට ඉහලින් උසස් සහතික පත්‍ර පුහුණුව අවසන් කර ඇත්නම් අදාල වැටුප් පරිමානයේ සඳහන් කාල සීමාව තුල අදාල වන ඔවුන් අංක 04 යටතේ වන දිරි දීමනා ගෙවීම ලබා ගැනීමට හිමිකම් ඇත්තාවූ වන්නේය.

11 පුහුණු පාඨමාලාව සම්පූර්ණ කල අය අගය වැඩිවූ හා විශිෂ්ඨ සේවාව සපයන සමිතිවලට සපයන අය වන හෙයින් මෙම පුහුණුවීම් සඳහා අයදුම් කරන සේවකයින් අදාල අනුප්‍රාප්තික විධි විධාන සමග මුදා හැරීමට සමිතිය ඉදිරිපත් විය යුතුය.

12 මෙම දිරි දීමනා ගෙවීම් කිරීමට පෙර අදාල සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

2015.05.28 දිනැති සමූපකාර සේවක කොමිෂන් සභා තීරණ අනුව අදාල චක්‍රලේඛය උතුරු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකගත්වය මත උතුරු පළාත් ගරු සමූපකාර සංවර්ධන අමාත්‍ය පී. අයින්ගරනේෂන් මහතාගේ අනුමැතිය සහිතව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අත්සන

පී. වාකීසන්, P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council

ලේකම්,

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත.

චක්‍රලේඛ අංක 05/2015

සමුපකාර සේවක කොමිෂන් සභාව,
උතුරු පළාත් සභාව,
35, අම්මන් වීදිය,
කන්දර්මඩම්,
යාපනය.
2015.05.28

උතුරු පළාතේ සියළුම සමුපකාර සමිති සහ සංගම්වල සභාපතිවරුන් වෙත.

**<u>සමුපකාර සේවකයින් සඳහා ජීවන වියදම් ගෙවීම</u>**

සමුපකාර සේවකයින්ට සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2012.03.14 දිනැති අංක 02/2012 දරණ චක්‍රලේඛය අනුව දැනට පවත්නා ජීවන වියම රු: 5850.00 ක මුදල ලෙවනු ලැබේ. මෙය පිළිබඳව සමාලෝචනය කල උතුරු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව ජීවන වියදම් වැඩි කිරීමක් සමුපකාර සේවකයින්ට ලබා දීමට තීරණය කර ඇත.

මෙම දීමනාව ගෙවීමට සමිතියට මූල්‍ය හැකියාව තිබිය යුතු අතර එය පිළිබඳව එම සමිතිවල අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත් විය යුතුය. ග්‍රාමීය බැංකුවෙන් ලැබෙන අදායම් හැර සමිතිය තම ස්වඋත්සාහයෙන් ලාභ උපයන්නේ නම් පහත සඳහන් ආකාරයෙන් අදාල දීමනා අදාල දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස්ගේ අනුමැතිය මත ගෙවිය යුතුය.

මෙම චක්‍රලේඛය නිකුත් වන දිනය වන 2015.06.01 සිට රු: 7800/- ක් ජීවන වියදම් වශයෙන් ගෙවිය යුතුය. තාවකාලික හා අනියම් සේවකයින් හට දිනකට රු: 260/- ක දීමනාවක් මසකට රු:7800/- ක් වැඩි නොවන අයුරින් ගෙවිය යුතුය.

කලින් සමුපකාර සේවක කොමිෂන් සභාව නිකුත් කල චක්‍රලේඛ අනුව ලබා දන ලද විශේෂ දීමනා විධි විධාන එලෙසම ඉදිරියටද පවත්වේ.

සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා එය සහභාගිත්වය සහ විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේදී මෙම දීමනාව ඇතුලත් කල යුතුය.

කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන සේවකයින්ටද මෙම දීමනාව හිමි නොවිය යුතුය.

මෙම ජීවන දීමනාව වැඩි වීම ගෙවීම සම්බන්ධව සමිතියේ කාරක සභාව විසින් ගනු ලබන තීරණය සම්බන්ධයෙන් 2015.08.01 දිනට පෙර අදාල දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් මගින් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත දැනුවත් කල යුතුය.

මෙම චක්‍රලේඛය උතුරු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකගත්වය මත පළාත් සමුපකාර සංවර්ධන අමාත්‍ය පි. අයින්ගරනේෂන් මහතාගේ අනුමැතිය සමග ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අත්සන

පි. වාකීසන්,
ලේකම්.

P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council